සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Department of Education, Southern Province

## පළමු වාර පරීක්ෂණය 2019 මාර්තු
## First Term Test, March 2019

II ශ්‍රේණිය Grade 11 | භූගෝල විද්‍යාව - I | පැය එකයි One hour

උපදෙස් :
- මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 40 කින් සමන්විතය.
- එක් එක් ප්‍රශ්න සඳහා දී ඇති උපදෙස් වලට අනුකූලව සියලුම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

---

- **අංක 01 සිට 01 දක්වා ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**

01 පෘථිවිය මතුපිට වර්ග ප්‍රමාණය වර්ග කිලෝ මීටර් මිලියන ........................................................ පමණ වේ. ( 710 / 910 / 510 )

02 පෘථිවි .......................................................... සියල් හා සිමැග් යන ස්තර දෙකකින් සමන්විත වේ. ( කබොල / ප්‍රාවරණය / හරය )

03 භූමියේ උස අනුව උෂ්ණත්වය වෙනස් වීම ........................................................ ලෙස හැඳින්වේ. ( වායු පීඩනය / පතන ශීඝ්‍රතාවය / වාෂ්පීකරණය )

04 වායු ගෝලයේ වායු වලින් වැඩි ප්‍රමාණයක් අන්තර්ගතව ඇත්තේ ........................................................ ගෝලයේය. ( අයන / පරිවර්ති / අපරිවර්ති )

05 ආසියා මහාද්වීපික තටකය තුළ ........................................................ දූපත පිහිටා ඇත. ( සුමාත්‍රා / මැඩගස්කර් / නවසීලන්ත )

06 ආසියාවෙන් බැහැර වී වගාකරන ප්‍රදේශයක් ලෙස ........................................................ වැදගත් වේ. ( උතුරු ඇමරිකාවේ මිසිසිපි නිම්නය / ඉන්දුනීසියාව / චීනය )

07 ශ්‍රී ලංකාවේ බහුලව කජු වගා කරන දිස්ත්‍රික්කයක් ලෙස ........................................................ වැදගත් වේ. ( මාතර / කුරුණෑගල / මන්නාරම )

08 ........................................................ ඛනිජ සම්පත් වර්ගයට අනුව ලෝහමය නොවන ඛනිජයක් වේ. ( යපස් / රූටයිල් / මිනිරන් )

09 දමෝදාර් යපස් නිධිය පිහිටා ඇත්තේ ........................................................ ( ඕස්ට්‍රේලියාවේය / චීනයේය / ඉන්දියාවේය )

10 ........................................................ විපරිත පාෂාණයකි. ( දියමන්ති / ගල් අඟුරු / ග්‍රැනයිට් )

- **අංක 11 සිට 15 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශයන් නිවැරදිනම් "නි" යන්න වටා ද, වැරදිනම් "වැ" යන්න වටා ද රවුමක් අඳින්න.**

11 අප්‍රිකාවේ නයිල් ගඟ වික්ටෝරියා විලෙන් ආරම්භ වේ. ( නි / වැ )

12 තිරිඟු වගාවේ විශේෂ ලක්ෂණයක් වන්නේ මහා පරිමාණ ලෙස වගා කිරීමයි. ( නි / වැ )

13 ආග්නේය, අවසාදිත, විපරිත පාෂාණ වලින් ශිලා ගෝලය නිර්මාණය වී ඇත. ( නි / වැ )

14 මල්, පලතුරු, බුලත්, මිරිස්, විසිතුරු පැල ආදිය සාම්ප්‍රධායික අපනයන බෝග වේ. ( නි / වැ )

15 ඔසාකා, කෝබේ, යොකොහමා වැනි ප්‍රදේශ ජපානයේ වානේ නිෂ්පාදිත මධ්‍යස්ථාන වේ. ( නි / වැ )

- අංක 16 සිට 21 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.

16 පෘථිවි ශිලා ගෝලයේ පවතින භූ තැටි චලන වන්නේ ප්‍රාවරණය තුළ ක්‍රියාත්මක වන ................................................................................ මඟිනි.

17 මුහුදු මට්ටමේ සිට වඩාත් උසින් පිහිටි සානුව වන්නේ ........................................................................................ ය.


18 මනා සංවිධානයකින් හා කළමණාකාරිත්වයකින් යුක්තව පුහුණු ශ්‍රමය භාවිත කර අපනයනය මුල් කරගෙන සිදු කරන භෝග වගාව ........................................................................ කෘෂි කර්මය වේ.

19 මහ ඉලුප්පල්ලම, බතලෙගොඩ, අම්බලන්තොට යන ස්ථානවල ........................................................................ පර්යේෂණ ආයතන පිහිටුවා ඇත.

20 ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන ග්‍රැනයිට්, බැසෝල්ට් වැනි පාෂාණ අයත් වන්නේ ................................................................................ පාෂාණ ගණයටය.

21 1 : 50,000 පරිමාණයට අනුව අඳින ලද ශ්‍රී ලංකාවේ භූ ලක්ෂණ සිතියමක් මත සෙන්ටිමීටර 02 කින් දක්වෙන දුරක් සැබෑ භූමියෙහි කිලෝමීටර ........................................................................කට සමාන වේ.

- පහත දක්වෙන ප්‍රස්ථාරය උපයෝගී කර ගෙන අංක 22 සිට 25 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




22 දළ ඉතිරි කිරීමේ වැඩි ප්‍රතිශතයක් වාර්තා වන්නේ ........................................................................ වර්ෂයේ දී ය.

23 දළ ආයෝජන ප්‍රතිශතයේ වැඩිම වර්ධනය පෙන්නුම් කරනුයේ ........................................................................ වර්ෂයේ දී ය.

24 ප්‍රස්ථාරයට අනුව දළ දේශිය ඉතිරි කිරීමේ අඩු ප්‍රතිශතයක් වාර්තා වන්නේ ........................................................................ වර්ෂයේ දීය.

25 2009 සිට 2012 දක්වා සමස්ත දළ ආයෝජනය ක්‍රමයෙන් ........................................................................ වී ඇත.

- **අංක 26 සිට 30 දක්වා ඇති ප්‍රශ්නවල "අ" සහ "ආ" තීරුවේ ඇති තොරතුරුවල අනුපිළිවෙලට අනුව "ආ" තීරුවේ ඇති තොරතුරු ගැළපුවිට නිවැරදි අනුපිළිවෙල දක්වෙන පිළිතුරට හිමි අංකය ඉදිරිපස ඇති තිත් ඉරමත ලියා දක්වන්න.**

26

| "අ" | "ආ" |
|---|---|
| ප්‍රධාන සාගර | පිහිටා ඇති මුහුදු |
| 1. අත්ලාන්තික් සාගරය | A අරාබි මුහුද |
| 2. ඉන්දියන් සාගරය | B කැරිබියන් මුහුද |
| 3. පැසිෆික් සාගරය | C බෝෆට් මුහුද |
| | D ජපන් මුහුද |

(1) A, B, D (2) B, A, D (3) C, B, A (4) D, B, C (.........)

27 "අ" "ආ"

| වගාවන් | ව්‍යාප්ත වී ඇති රටවල් |
|---|---|
| 1. වී වගාව | A කැනඩාව |
| 2. තේ වගාව | B නවසීලන්තය |
| 3. තිරිඟු වගාව | C කෙන්යාව |
| | D ඉතාලියේ පෝ ගංගා නිම්නය |

(1) A, B, D (2) B, A, C (3) C, A, D (4) D, C, A (..........)

28 "අ" "ආ"

| තේ වගාව | ව්‍යාප්ත වී ඇති ප්‍රදේශ |
|---|---|
| 1. උඩරට තේ | A බදුල්ල |
| 2. මැද රට තේ | B කෑගල්ල |
| 3. පහතරට තේ | C නුවරඑළිය |
| | D ගාල්ල |

(1) A, C, B (2) B, A, D (3) C, A, D (4) D, A, B (..........)

29 "ආ" "ආ"

| පස් වර්ග | ව්‍යාප්ත වී ඇති ප්‍රදේශ |
|---|---|
| 1. රතු දුඹුරු පස් | A මහනුවර |
| 2. රතු කහ පොඩ්සොල් පස් | B දමන |
| 3. රතු දුඹුරු ලැටසොල් පස් | C කළුතර |
| | D අනුරාධපුරය |

(1) A, B, C (2) B, A, C (3) C, D, A (4) D, C, A (..........)

30 "අ" "ආ"

| වනාන්තර | විශේෂ ලක්ෂණ |
|---|---|
| 1 නිවර්තන වර්ෂා වනාන්තර | A සිසර සෘතුවේදී ගස්වල කොළ හැළේ. |
| 2. සෞම්‍ය කලාපීය වන්නාන්තර | B වනාන්තර ස්ථර කිහිපයකි |
| 3. කේතුධර වනාන්තර | C මහෝගනී, ඕක් වැනි ගස් වර්ග ඇත |
| | D ගස් වැඩි ප්‍රමාණයක් කේතුරූපාකාර |

(1) A, B, C (2) B, A, D (3) C, A, B (4) D, C, A (..........)

- **අංක 31 සිට 40 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු හතරෙන් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ඊට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉරමත ලියන්න.**

31 ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළ කලාපයේ සංචාරක ස්ථාන ඇතුළත් පිළිතුර වන්නේ,

(1) නිලාවේලි, පාසිකුඩා, ආරුගම්බේ

(2) නිලාවේලි, පාසිකුඩා, කල්පියටිය

(3) පාසිකුඩා, කතරගම, හික්කඩුව

(4) නිලාවේලි, ආරුගම්බේ, බෙන්තොට (..........)

32 • 2000 mm වැඩි වර්ෂාපතනය

• $27^0C$ පමණ සාමාන්‍ය උෂ්ණත්වය

• කබොක් මිශ්‍ර රතු පස

• මද බෑවුම් සහිත අඩු උස් බිම් ප්‍රදේශ

ඉහත සඳහන් භෞතික සාධක වැදගත්වන්නේ කිනම් වගාවක් සඳහා ද?

(1) වී (2) තේ (3) රබර් (4) පොල් (..........)

33 හෙල්මළු ක්‍රමයට වී වගා කරන දිස්ත්‍රික්ක පමණක් දක්වෙන පිළිතුර වන්නේ,

(1) ගාල්ල, කොළඹ, කුරුණෑගල (2) නුවරඑළිය, මාතලේ, යාපනය

(3) මහනුවර, මාතලේ, නුවරඑළිය (4) ගාල්ල, අනුරාධපුරය, මාතලේ (..........)

34 ලෝකයේ තිරිඟු වගාවට ආවේණික සාධක ඇතුළත් පිළිතුර වන්නේ,

(1) $15^0C$ - $17^0C$ උෂ්ණත්වය, ලෝම් ලැටරයිපස, මද බෑවුම් ප්‍රදේශ.

(2) $27^0C$ උෂ්ණත්වය, 2000mm වර්ෂාපතනය, කබොක් මිශ්‍ර රතු පස

(3) $27^0C$ පමණ උෂ්ණත්වය, 2000 mm වර්ෂාපතනය, දියළු පස

(4) 300 mm - 500 mm අතර වර්ෂාපතනය, පැල වැඩෙන කාලයේ සිසිල් තෙත් දේශගුණය, චර්නෝසම් පස

35 ස්වාභාවික සම්පත් අතර ක්ෂය නොවන සම්පත් ගණයට අයත් වන්නේ,

(1) වනාන්තර, ජලය, පස (2) ජලය, සූර්යාලෝකය, වාතය

(3) පාෂාණ, පස, වනජීවීන් (4) යපස්, තඹ, ගල් අඟුරු (..........)

36 කෙඔලින් මැටි වර්ගය බහුල වශයෙන් දක්නට ලැබෙන ප්‍රදේශයක් වන්නේ,

(1) මීගමුව (2) මිටියාගොඩ (3) දෙදියවල (4) කැලණිය (..........)

37 පෙට්‍රෝ රසායන කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදන පමණක් ඇතුළත් පිළිතුරක් වන්නේ,

(1) ප්ලාස්ටික්, කෘතිම රබර්, ලිහිසි තෙල්

(2) ප්ලාස්ටික්, යකඩ, ඖෂධ වර්ග

(3) බොරතෙල්, රූපලාවර්ණ ආලේපන, තීන්ත වර්ග

(4) කෘත්‍රිම රබර්, පිඟාන් භාණ්ඩ, කෘමිනාශක (..........)

38 සිතියමක සංකේත හා වර්ණ වලින් කියැවෙන දේ අවබෝධ කර ගැනීමට අවශ්‍ය වන්නේ,

(1) දිශාවයි (2) පරිමාණයයි (3) සංකේතයි (4) සූචකයයි (..........)

39 ශ්‍රී ලංකා භූමිය ආවරණය වන ලෙස සකස් කොට ඇති සිතියම් එක් කොටසක භූමියේ විශාලත්වය වන්නේ,

(1) වර්ග කිලෝමීටර් 1000 කි. (2) වර්ග කිලෝමීටර් 100 කි.

(3) වර්ග කිලෝමීටර් 250 කි. (4) වර්ග කිලෝමීටර් 500 කි. (..........)

40 වායු ගෝලයේ හා ජලගෝලය අතර ජලය හුවමාරු වීමේ ක්‍රියාවලිය හැඳින් වෙන්නේ,

(1) වර්ෂණය (2) උත්ස්වේදනය (3) ජල චක්‍රය (4) වාෂ්පීකරණය (..........)

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Department of Education, Southern Province**

**පළමු වාර පරීක්ෂණය 2019 මාර්තු**
**First Term Test, March 2019**

| | | |
|---|---|---|
| 11 ශ්‍රේණිය Grade 11 | භූගෝල විද්‍යාව - II | පැය දෙකයි Two hours |

උපදෙස් :

- මෙම ප්‍රශ්න පත්‍රය I, II වශයෙන් කොටස් දෙකකින් සමන්විතය.
- I කොටසේ ප්‍රශ්නය අනිවාර්ය වේ. එහි (අ), (ආ) සහ (ඉ) යන කොටස් තුනටම පිළිතුරු සැපයිය යුතුය.
- II කොටසින් ප්‍රශ්න හතරකට පිළිතුරු සැපයිය යුතුය.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

## I - කොටස

(01) (අ) ඔබ වෙත සපයා ඇති 1:50000 හු ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කොට ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ඔබ වෙත සපයා ඇති පිළිතුරු කඩදාසිය යොදා ගන්න.

(i) අංක 01 න් දක්වා ඇත්තේ කුමක් ද? ( තුඩුව / වැලිපරය / දූපත ) (ලකුණු 01)

(ii) අංක 02 න් දක්වා ඇත්තේ, ( වැලිපරයකි / රක්ෂිත මායිමකි / පාෂාණ උද්ගතයකි ) (ලකුණු 01)

(iii) අංක 03 න් දක්වා ඇති මායිම වන්නේ, ( පළාත් මායිම් / දිස්ත්‍රික් මායිම් / ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස මායිම් ) (ලකුණු 01)

(iv) අංක 04 න් දක්වා ඇත්තේ කුමක් ද? ( බොක්ක / කළපුව / වගුරු බිම ) (ලකුණු 01 )

(v) අංක (05) න් දක්වා ඇත්තේ, ( ගං මෝය / නිම්නය / අතුගංගාව ) (ලකුණු 01)

(vi) A අක්ෂරයෙන් දක්වෙන අක්ෂාංශ රේඛාව නිවැරදිව නම් කරන්න. (ලකුණු 01)

(vii) ප්‍රදේශයේ බහුලව ව්‍යාප්ත වී ඇති ව්‍යාපාරික භෝගය කුමක් ද? (ලකුණු 01)

(viii) B අක්ෂරයෙන් දක්වා කොටු කර ඇති ජනාවාසයේ දක්නට ඇති පොදු සේවා සපයන ආයතන 02 ක් නම් කරන්න. (ලකුණු 02)

(ix) මෙම ප්‍රදේශයේ දියුණු කළ හැකි කර්මාන්තයන් නම් කරන්න. (ලකුණු 01)

(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යනය කර පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ලෝක සිතියමට යාබද තීරුව භාවිත කරන්න.

(i) A, B, C අක්ෂර අතුරෙන් රතු මුහුද දක්වෙන අක්ෂර කුමක් ද?

(ii) D, E, F වලින් දක්වා ඇති අක්ෂර අතුරෙන් ඇමසන් ගංගාව දක්වෙන්නේ කුමන අක්ෂරයෙන් ද?

(iii) G, H, J අක්ෂර අතුරෙන් මැඩගස්කරය දක්වෙන්නේ කුමන අක්ෂරයෙන් ද?

(iv) K, L, M අතරින් ඇල්ප්ස් වැටිය දක්වෙන අක්ෂරය කුමක් ද? (ලකුණු 05)

(ඉ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යනය කර පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ලංකා සිතියමට යාබද තීරුව භාවිත කරන්න.

(i) A, B, C වලින් දක්වෙන අක්ෂර අතුරෙන් ජන සංඛ්‍යාව අඩුම දිස්ත්‍රික්කය වන මුලතිව් දක්වෙන අක්ෂරය කුමක් ද?

(ii) ශ්‍රී ලංකාවේ වැඩි වශයෙන් රබර් වගා කර ඇති කළුතර දිස්ත්‍රික්කය දක්වෙන්නේ D E F අතරින් කුමන අක්ෂරයෙන් ද?

(iii) G, H, J අක්ෂර අතුරෙන් දෙවිනුවර ධීවර වරාය දක්වෙන අක්ෂරය කුමක් ද?

(iv) K, L, M අක්ෂර අතුරෙන් සුළු අපනයන භෝග පර්යේෂණ ආයතනය පිහිටි මාතලේ දිස්ත්‍රික්කය දක්වෙන්නේ කුමන අක්ෂරයෙන් ද?

(v) N, P, Q අක්ෂර වලින් ඩෙල්ෆ් දූපත දක්වෙන අක්ෂරය කුමක් ද? (ලකුණු 05)

## II - කොටස

(02) (i) පෘථිවි ව්‍යුහය අනුව ශිලා ගෝලයට අයත්වන කොටස් 02 නම් කරන්න (ලකුණු 02)

(ii) ශිලා ගෝලයට මිනිසා විසින් කරන ලද බලපෑම් 03 ක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) (a) පෘථිවි ශිලා ගෝලය නිර්මාණ වී ඇති භූ තැටි දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(b) මිනිසා විසින් ශිලා ගෝලයට කරන බලපෑම් අවම කිරීම සඳහා ඔබට ගත හැකි ක්‍රියා මාර්ග 02 ක් යෝජනා කරන්න. (ලකුණු 03)

(03) (i) ශ්‍රී ලංකාවේ වී වගා කරන පරිසර කලාප දෙකක් පහත දක්වේ. එම කලාප වලට අයත් දිස්ත්‍රික්ක එක බැගින් සඳහන් කරන්න.

A තෙත් කලාපය -

B අතර මැද කලාපය - (ලකුණු 02)

(ii) වියළි කලාපීය වී වගාවේ ප්‍රධාන ලක්ෂණ 03 ක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) (a) වී වගාව ව්‍යාප්ත වීම සඳහා බලපාන භෞතික සාධක දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(b) ශ්‍රී ලංකාවේ වී වගාවේ මෑත කාලීන ප්‍රවණතා 02 ක් කෙටියෙන් විසිතර කරන්න. (ලකුණු 03)

(04) (i) යකඩ හා වානේවල ඇති ගුණ ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) (a) ජපානයේ යකඩ හා වානේ නිෂ්පාදිත මධ්‍යස්ථාන 02 ක් සඳහන් කරන්න. (ලකුණු 02)

(b) ඔබ නම් කළ මධ්‍යස්ථානවල යකඩ හා වානේ කර්මාන්තය ස්ථාන ගත වීමට බලපා ඇති සාධක එකක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) මෝටර් රථ කර්මාන්තයේ මෑතකාලීන ප්‍රවණතා 02 ක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(05) (i) ශ්‍රී ලංකාවේ ව්‍යාප්ත වී ඇති ගෘහ කර්මාන්ත 02 ක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) ගෘහ කර්මාන්ත ආශ්‍රිත පැන නැගී ඇති ගැටලු තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) (a) ශ්‍රී ලංකාවේ ප්‍රධාන සංචාරක කලාප 02 සඳහන් කරන්න. (ලකුණු 02)

(b) සංචාරක කර්මාන්තයේ මෑත කාලීන ප්‍රවණතා තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)


(06) (i) ස්වාභාවික සම්පත්වල ආයාසයෙන් ලබා ගන්නා සම්පත් වර්ග 02 ක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) පාෂාණ උපත අනුව වර්ග තුනකට බෙදා ඇත. ඒවා නම් කරන්න. (ලකුණු 03)

(iii) (a) පාෂාණ වලින් ඇති ප්‍රයෝජන 02 ක් සඳහන් කරන්න. (ලකුණු 02)

(b) පාෂාණ පරිහරණයේ දී මිනිසුන් මුහුණපාන ගැටලු 02 ක් දක්වා ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 03)

(07) (i) යාබද රූප සටහනේ A B වලින් දක්වා ඇති ලෝකයේ ප්‍රධාන දේශගුණික කලාප නම් කරන්න. (ලකුණු 02)




(ii) නිවර්තන දේශගුණයේ කැපී පෙනෙන ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) වනාන්තර විනාශ කිරීමේ දී මිනිසාට ඇති වන බලපෑම් 02 ක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(08) (i) ශ්‍රී ලංකාවේ මැණික් ලැබෙන ප්‍රදේශ 02 ක් නම් කරන්න. (ලකුණු 02)

(ii) මිනිරන් වලින් ලබා ගත හැකි ප්‍රයෝජන 03 ක් ලියන්න. (ලකුණු 03)

(iii) (a) පස නිර්මාණය වීමට බලපාන සාධක 02 ක් ලියන්න. (ලකුණු 02)

(b) පස සංරක්ෂණය කිරීමේ දී අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග 03 ක් ලියා දක්වන්න. (ලකුණු 03)

භූගෝල විද්‍යාව II
புவியியல் II
Geography II

ශ්‍රේණිය/Grade : ....................

විභාග අංකය
சுட்டெண்
Index Number ..........................................

පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය පිණිසයි.
பரீட்சகரின் உபயோகத் துக்கு மட்டும்
For Examiner's Use Only

(01) / (அ) / (අ)

(i) ..........................................................................

(ii) ..........................................................................

(iii) ..........................................................................

(iv) ..........................................................................

(v) ..........................................................................

(vi) ..........................................................................

(vii) ..........................................................................


(viii) ..........................................................................

..........................................................................

(ix) ..........................................................................

10

01 (ආ)




(i)

(ii)


(iii)

(iv)

(v)

/5

01 (ඉ)




(i)

(ii)

(iii)

(iv)

(v)

/5

01 (අ) /10 + (ආ) /5 + (ඉ) /5 = /20